මැතිවරණ කොමිෂන් සභාව
0 9 JAN 2026
නීති අංශය
රාජගිරිය

# නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ

## ව්‍යවස්ථාව (සංශෝධිත -30-09-2024)

පූර්විකාව:

පක්ෂය පිහිටුවීමේලා මූලික අරමුණ ලෙස දැක්වෙන්නේ අප සැමගේ දේශපාලන ගුරුවරයා වූ අප රට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයේ ඉදිරිපෙළ කෘතහස්ත බුද්ධිමත් නායකත්වය ලබා දුන් දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමන් ගේ ප්‍රතිපත්ති හා අරමුණු ඉදිරියට ගෙන යාම හා ඉටුකිරීම වෙනුවෙන් කැප වීමටය.

අප පක්ෂය ආමන්ත්‍රණය කරනු ලබන්නේ, පැහැදිලි කැපවීමක් ඇති විශ්වාසය දනවන නායකත්වයක් අපේක්ෂාකරන්නා වූ, එමෙන්ම ජනතාව කෙරෙහි සැබෑ සැලකිල්ලක් හා එම ජනතාව සහභාගිකත්වය ඇතිව ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමට ශක්තියක් හා සැබෑ උවමනාවක් ඇති නායකත්වයන් අපේක්ෂා කරන ජනතාවටය.

අසීමිත බලතල සහිත ඒකාධිපති ස්වරූපයේ ජනාධිපතිධූරය අප පක්ෂය ප්‍රතික්ෂේප කරයි. අප යථාභූත ප්‍රජාතන්ත්‍රවාදයක් උදෙසා වූ, එමෙන්ම ජනතාවගේ අවශ්‍යතාවයන් අනුව, අවුන්ගේ කැමැත්ත පරිදි ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන රජයක් උදෙසා වූ සැබෑ දේශපාලන ව්‍යාපාරයක් නියෝජනය කරන්නෙමු.

### 1. *පරමාර්ථ සහ අරමුණු:*

1-1 නිදහස්, සාධාරණ හා සත්‍ය ප්‍රජාතන්ත්‍රවාදී දේශයක් වෙනුවෙන් කැප වූ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයක් මෙහෙය වීම.

1-2 සෑම පුද්ගලයෙකුටම සිය මූලික මිනිස් අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස සහතික කරන සාම ජාතියකට, ආගමකට අයත් තම සහෝදර ජනතාව සමග සාමයෙන්, ඉවසීමෙන් හා අවබෝධයෙන් ජීවත් විය හැකි රටක් වෙනුවෙන් පෙනී සිටීම.

1-3 සාරවත්,සමෘද්ධිමත් රටක්, අනාගත පරපුර වෙනුවෙන් සුරක්ෂිත කිරීම වෙනුවෙන් මානව හා ස්වාභාවික සම්පත් ප්‍රඥාගෝචර ලෙස පරිහරණය කිරීම.

1-4 පාර්ලිමේන්තු, ප්‍රාදේශීය පරිපාලනය, පළාත් පාලනය සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය අනුව හැඩ ගැස්වීම.

1-5 මැතිවරණවලදී බලයට පත්වීම අරමුණු කරගත්, නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂයක් ලෙස ක්‍රියා කිරීම සහ සමාන අරමුණු ඇති දේශපාලන පක්ෂ, කණ්ඩායම් සමග සන්ධාන ගත වීම.

1-6 පක්ෂයේ විධායක සැබෑව විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

1-7 ජනතාවගේ දේශපාලන, ආර්ථික හා සමාජයීය උන්නතිය වෙනුවෙන් ක්‍රියාශීලීව පෙනීසිටීම.

2. *පක්ෂයේ අනන්‍යතාව.*

2:1. පක්ෂයේ නම නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ වේ.

2 :2. එනමුත් මෙම පක්ෂය තනි පක්ෂයක් ලෙසද දේශපාලන අවශ්‍යතා පරිදි සන්ධානයක් ලෙසද සාමාජික පක්ෂ වල එකතුවක් ලෙසද කටයුතු කරනු ලබයි

3. *සාමාජිකත්වය:*

3:1. සාමාජිකත්වය, පුද්ගල හෝ සංවිධාන සාමාජිකත්වය වශයෙන් ලියා පදිංචි විය හැක.

3: 2. යාවජීව සාමාජිකයන් (පක්ෂ ආරම්භයේ සිට ක්‍රියාකාරීන්)

3: 3. (අ) වයස අවුරුදු 16ට නොඅඩු අයට පක්ෂ සාමාජිකත්වය ලැබීමට සුදුසු කම් ඇත.

(ආ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පිළිගනු ලබන, සාමාජිකයින් 12 ට නොඅඩු වෘත්තීය සමිති, ස්වේච්ඡා සංවිධාන, ශිෂ්‍ය සමිති, සඳහා සාමාජිකත්වය පිරිනැමිය හැක.

3: 4. (අ).පක්ෂ භාණ්ඩාගාරික විසින් නිකුත්කරනු ලබන අයදුම්පත් පුරවා, කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියමිත සාමාජික මුදල සමග පක්ෂ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් පක්ෂ සාමාජිකත්වය ඉල්ලුම් කල හැක.

(ආ). යම් සංවිධානයක් පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, අදාළ අයදුම් පත පුරවා පක්ෂ ලේකම් වෙත බාර දීමෙන් සාමාජිකත්වය ඉල්ලුම් කල හැක.

(ඇ ). පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පක්ෂ සාමාජිකත්වය පිරිනමනු ඇත.

(ඈ ). පක්ෂයේ සාමාජිකයෝ, කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වාර්ෂික සාමාජික මුදලක් ගෙවිය යුතු වන්නේය.

4. *පක්ෂ සංවිධානය.*

4: 1. පක්ෂයේ සංවිධාන

. කොට්ඨාශ/දිස්ත්‍රික් දේශපාල කමිටු.

. විධායක සබාව

. කෘත්‍යාධිකාරී මණ්ඩලය

. දේශපාලන කමිටුව

. වෙනත් සංවිධාන

4: 2 (අ). කොට්ඨාශ/දිස්ත්‍රික් දේශපාලන කමිටු

පක්ෂයේ දේශපාලන කටයුතු මෙහෙය වීම සඳහා කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් .දේශපාලන කමිටු පිහිටුවා ගත හැකිය.

(ආ). එක් කමිටුවකට අවම වශයෙන් පක්ෂ සාමාජිකයින් 10ක් සිටිය යුතුය. කමිටුව මෙහෙය වීම සඳහා සභාපති ලේකම් භාණ්ඩාගාරික යන නිල සඳහා තිදෙනෙකු තෝරා මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කොට පක්ෂයේ ලියා පදිංචි කල යුතු වේ.

(ඇ). වයස අවුරුදු 40ට අඩු පිරිමි හා කාන්තා සාමාජිකයින් 10ට නොඅඩු ප්‍රමාණයකට පොදු යොමුන් කමිටුවක් පිහිටුවා ගත හැක.

(ඈ). පක්ෂයේ නමින් පිහිටුවනු ලබන සියලු සංවිධාන පක්ෂයේ ලියා පදිංචි කල යුතුය.

<u>4. 3 *කෘත්‍යාධිකාරී- විධායක මණ්ඩලය* :</u>

පක්ෂයේ දේශපාලන කටයුතු මෙහෙය වීම,පරිපාලනය, විධායක සභාවේ අනුමැතිය ඇතිව තීරණ ගැනීම ඇතුළු ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ.

4 .3 1 :. *කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සංයුතිය*

නිලධාරී මණ්ඩලය ඇතුළුව හතලිස්පස් (45) දෙනෙකුගෙන් සමන්විත වේ.

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අභිමතය පරිදි දෙදෙනෙකුට නො වැඩි අනුශාසකවරුන් පත්කර ගත හැක.

4. 3 2 :- නිලධාරී මණ්ඩලය පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| (අ). සභාපති | 01 |
| (ආ). ජ්‍යෙෂ්ඨ උප සභාපති | 07 |
| (ඇ). උප සභාපති | 02 |
| (ඈ). මහ ලේකම් | 01 |
| (ඉ). ප්‍රධාන භාණ්ඩාගාරික | 01 |
| (ඊ). නියෝජ්‍ය ලේකම් | 01 |
| (උ) උප ලේකම් | 01 |
| (ඌ). උප භාණ්ඩාගාරික | 01 |
| (එ). ජාතික සංවිධායක | 01 |

එනමුත් ඉහත සඳහන් අංක 3 යටතේ පක්ෂය සම අදහස් ඇති පක්ෂ සමග සන්ධාන ගතවන අවස්ථාවලදී ජ්‍යෙෂ්ඨ උප සභාපති තනතුරු වලින් අවශ්‍ය ප්‍රමාණයක් එකී සාමාජික පක්ෂ වලින් නම් කරනු ලබන නියෝජිතයන් පත් කල යුතු වේ

අනුශාසකවරුන් සහ විධායක සභාව විසින් නම් කරනු ලබන, කාරක සභිකයන් 05 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්ද විධායක සභාව විසින් පත් කරනු ලබන තවත් විසි හතර (24) දෙනෙකුගෙන්ද සමන්විත වේ.

4 3 3 : *පක්ෂයේ මහ ලේකම් ධූරය:*

(අ). පක්ෂයේ මහ ලේකම් ධූරය සඳහා පත්කරනු ලබන තැනැත්තා, කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඒක මතික අනුමැතියෙන් පත්කර ගත යුතුය. එසේ නොවන්නේ නම්, එම තැනැත්තා හට, කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයන් 2/3කගේ අනුමැතිය අවශ්‍ය වේ.

(ආ). මහ ලේකම් ධූරය පුරප්පාඩු විය හැක්කේ, ධූරය දරන්නාගේ ඉල්ලා අස්වීම හෝ සිය රාජකාරී ඉටු කල නොහැකි තත්වයක් මත හෝ බරපතල විනය විරෝධී ක්‍රියාවක් හේතුවෙන් හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ එකමතික හෝ 2/3 ක අනුමැතිය ලත් යෝජනා සම්මතයකින් හෝ වේ.අදාළ යෝජනාව විධායක සභාව විසින් සම්මත කල යුතු වේ.

4 3 4. .*පක්ෂයේ සභාපති ධූරය:*

(අ). පක්ෂයේ සභාපතිවරයා,කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශය මත, විධායක සභාවේ අනුමැතියෙන් පත් කල යුතු වේ.

(ආ). කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සහ විධායක සභාවේ මුලසුන, සභාපතිවරයාට , නිලබලයෙන් හිමි වේ. පක්ෂයේ සෑම නිල රැස්වීමක්ම සභාපතිවරයාගේ මූලිකත්වයෙන් පැවැත්විය යුතු අතර ඔහු නොමැති අවස්ථාවක, තාවකාලික සභාපතිවරයෙකු පත් කර ගැනීමට අදාළ රැස්වීමේ සාමාජිකයින්ට බලය ඇත.

(ඇ). පක්ෂය මෙහෙයවීමේ කටයුතුවලදී සභාපතිවරයා ක්‍රියාකාරී ලෙස මැදිහත් විය යුතුය.

(ඈ). පක්ෂයේ අත්‍යාවශ්‍ය තීරණ ගැනීමට අවශ්‍ය අවස්ථාවලදී කෙටි දැනුම්දීමකින් පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය හා/හෝ විධායක සභාව(අවම වැඩ කරන (03) දින තුනක) දැනුම් දීමකින් ලේකම් වරයා මගින් කැඳවීමේ බලය ඇත.

4 .3 5 :*කෘත්‍යාධිකාරී මණ්ඩලයේ බලතල සහ වගකීම්:*

(අ) :කෘත්‍යාධිකාරී මණ්ඩලය පක්ෂයේ ක්‍රියාකාරී කමිටුව වේ.

(ආ). ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව නිලධාරී මණ්ඩලයේ සාමාජිකයන් පත්කිරීම හා ඉවත්කිරීම.

(ඇ). පක්ෂයේ විනය කටයුතු ගෙනයාම සඳහා විනය කමිටුවක් පත් කිරීම.

එනමුත් ව්‍යවස්ථාවේ 11 වන වගතියට යටත්ව පක්ෂයේ නිලධාරියෙකු කෘත්‍යාධිකාරී විධායක කමිටු සමජිකයෙකු යම් අවස්ථාවකදී විනය විරෝධී හෝ පක්ෂ තීරණයන්ට පටහැනිව පක්ෂ ස්ථාවරයට හානි වන ලෙස කටයුතු කරන බවට නිරීක්ෂණය වන අවස්ථා වලදී අදාල සාමාජිකයාගේ නිලතල වහාම අත් හිටුවා අනතුරුව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට සභාපති ලේකම් භාණ්ඩාගාරික තිදෙනාගේ කමිටුවට බලය ඇත්තේය

(ඈ). යම් නිලධාරියකු හෝ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

:ඉ අවශ්‍යතාව පරිදි නාම යෝජනා මණ්ඩල, අනු කමිටු කාරක සභා පත් කිරීම සහ ඒ සඳහා නිර්නායකයන් තීරණය කිරීම.

:ඊ පක්ෂයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය රීති සම්පාදනය කිරීම. පක්ෂයේ විධායක සභාව කැඳවීම/ නියෝජිත සංඛ්‍යාව නියම කිරීම/න්‍යාය පත්‍රය සකස් කිරීම/නිලධාරි මණ්ඩලය සඳහා නාම යෝජනා කන්ද වීම/පුරප්පාඩු පිරවීම.ඒ පක්ෂයේ අරමුදල් සම්පාදනය කිරීම හා පරිපාලනය.

උ මැතිවරණ සඳහා අපේක්ෂකයන් සහ සංවිධායකයන් පත්කිරීම.

ඌ පක්ෂයේ ඉදිරි ගමන සඳ අවශ්‍ය යැයි සිතන දේශපාලන තීරණ ගැනීම.

ඍ කාලීන අවශ්‍යතාව පරිදි පක්ෂ ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කිරීම.

ඎ කෘත්‍යාධිකාරී මණ්ඩල යේ ගණපූරණය තුනෙන් එකක් (1/3) වේ.

4. 4 *දේශපාලන කමිටු :*

*4 4 1* :(අ) පක්ෂයේ නිලධාරි මණ්ඩලයේ සාමාජිකයින් දේශපාලන මණ්ඩලයට අයත් වේ.

එනමුත් පක්ෂයේ ඉදිරිගමනට අදාලව හදිසි අත්‍යවශ්‍ය තීරණ ගැනීමේදී හැකිතාක් දුරට අදහස් විමසා ඒකමතික තීරණයන්ට එළඹීමට සභාපති ලේකම් සහ භාණ්ඩාගාරික තිදෙනා ඇතුළු කමිටුවට බලය ඇති අතර එම තීරණ හැකි ඉක්මනින් කෘත්‍යාධිකාරී විධායක කමිටුව වෙත දැනුම් දීමට කටයුතු කල යුත්තේය

දේශපාලන මණ්ඩල සාමාජිකයින්ගේ කැමැත්ත සහ ආරාධනය මත, අනුශාසක/කාරක සභික තනතුරු දරන පුද්ගලයන්, අවශ්‍යතාව පරිදි, රැස්වීම්වලට සහභාගී කරවා ගත හැක.

(ආ). :රැස්වීම් වල ගණපූරණය පස්දෙනෙකු (05) වන අතර සභාපති, මහලේකම්, භාණ්ඩාගාරික යන නිලතල දරන්නන් අතුරින් දෙදෙනේකුග් සහභාගිත්වය අනිවාර්ය වේ.

(ඇ). කෘත්‍යාධිකාරී මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කිරීම, නිර්දේශ කිරීම සහ අනුමැතිය ලත් යෝජනා ක්‍රියාත්මක කිරීම.

(ඈ). පවතින දේශපාලන වාතාවරණයන් තුල පක්ෂය විසින් ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ සම අදහස් දරන වෙනත් පක්ෂ දේශපාලන ධාරාවන්, කණ්ඩායම් සමග සාකච්ජා කිරීම සහ ගතයුතු පියවර පිළිබඳ කෘත්‍යාධිකාරී මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

4 .5 *<u>ජාතික විධායක සභාව.</u>*

4. 5 .1: සංයුතිය:

(අ): පක්ෂයේ අනුශාසකවරු

(ආ). නිලධාරි මණ්ඩලය.

(ඇ). කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සෙසු සාමාජිකයන්

(ඈ). මහජන නියෝජිතයන්/අපේක්ෂකයන්.

(ඉ). පක්ෂයේ යාවජීව සාමාජිකයන්( පක්ෂයේ ආරම්භයේ සිට ක්‍රියාකාරී ලෙස පක්ෂය සමග කටයුතුකළ අය).

(ඊ). කෘත්‍යාධිකාරී මණ්ඩලයනිර්දේශ කරනු ලබන පක්ෂ නියෝජිතයන් සංඛ්‍යාවක්.

4. 5. 2: *විධායක සභාවේ බලතල සහ වගකීම්.*

(අ). පක්ෂ ව්‍යවස්ථාවට යෝජනා කරනු ලබන සංශෝධන අනුමත කිරීම.

(ආ). පක්ෂ නාමය, ලාංඡනය පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය

(ඇ). කෘත්‍යාධිකාරී මණ්ඩලයට නියෝජිතයන් නම් කිරීම.

(ඈ). නිලධාරී මණ්ඩලයට නියෝජිත නම් අනුමත කිරීම.

(ඉ). කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සිදු කරන ලබන පත්වීම් වලට අනුමැතිය ලබා දීම.

(ඊ). ගිණුම් වාර්තා අනුමත කිරීම.

(උ). ස්ථාවර නියෝග අනුමත කිරීම.

(ඌ). ව්‍යස්ථාව සංශෝධනය සඳහා විධායක සභාවේ අනුමැතිය, පැමිණ සිටින සභිකයන්ගෙන් 50% සහ තවත් එක් (01) ඡන්දයක අවම අනුමැතිය ලබා ගත යුතු වේ.

4. 5. 3: *විධායක සභාව කැඳවීම*

(අ). පක්ෂයේ දේශපාලන කමිටුව විසින් හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් හෝ මහලේකම් වරයා වෙත කෙරෙන ඉල්ලීමක් හෝ අවශ්‍යතාව පැනනැගෙන විට ලේකම් විසින් හෝ, විශේෂ විධායක සභා රැස්වීම් කැඳවිය යුතුය.එසේ කැඳවීමට අවශ්‍යතාව, කැඳවීමේ ලිපියේ සඳහන් විය යුතුය.

(ආ). පක්ෂයේ ලේකම් විසින් වාර්ෂික විධායක සභාව කැඳවිය හැක.

(ඇ). වාර්ෂික සභාව පැවැත්වීමට නියමිත දිනයට, වැඩ කරන දින දහයකට (10) පෙර, නියෝජිතයන් වෙත දැන්විය යුතුය.

(ඈ). සභාපතිවරයාගේ හෝ මෙහි 4.6.3 (අ) යටතේ කරනු ලබන ඉල්ලීමකදී, කැඳවනු ලබන විධායක සභාව සඳහා අවම වැඩ කරන දින තුනක (03) දැනුම් දීමකින් සිදු කල හැක.

(ඉ). සභාවක් කැඳවීම සඳහා, ලිපි මගින්, ෆැක්ස්, දුරකථන කෙටි ප□විඩ හෝ වෙනත් පිළිගත් හැකි සේවා මගින් සිදු කල හැක.

ඊ- විධායක සභාවේ න්‍යාය පත්‍රය ලේකම් වරයා විසින් සකස් කර කෘත්‍යාධිකාරී සභාවට ඉදිරිපත් කල යුතුය.

5. *මැතිවරණ/ ඡන්ද විමසීම.*

5.1: ජනාධිපතිවරණ/පාර්ලිමේන්තු/පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ සඳහා අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමේදී සුදුසු පුද්ගලයන් ඒ සඳහා නම් කිරීම කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් කල යුතුය. ඒ සඳහා අවශ්‍ය නිර්දේශ දේශපාලන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා, පක්ෂයේ නාම යෝජනා පත්‍රයට අත්මත පරිදි ඇතුලත් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය ඇත.

5. 2: යම් මැතිවරණයක් සඳහා පක්ෂය නමින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා, ලේකම් විසින් අත්සන් කලයුතුය.

5. 3: පක්ෂයේ නමින් තේරී පත්වන මහජන නියෝජිතයන්ගේ වගකීම්, ක්‍රියාකාරකම් පිලිබඳ තීරණ ගැනීම කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු වගකීමක් වේ.

5 .4:පක්ෂයේ නම හා ලාංඡනය යටතේ තරඟ කර තේරී පත්වන මහජන නියෝජිතයන්,කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්ති හා තීරණ වලට අනුකූල වන පරිද්දෙන් ක්‍රියාකළ යුතු වන අතර, එසේ නොවන්නේ නම් එය විනය විරෝධී ක්‍රියාවක් සේ සලකා ක්‍රියා කල හැකි වන්නේය.

6. *සාමාජික ලේඛණ :*

පක්ෂයේ පරිපාල ලේකම් විසින් සාමාජිකයන්ගේ හා සංවිධානවල නිලධාරින්ගේ ලේඛණ පවත්වා ගත යුතුය.

7. *පක්ෂයේ අරමුදල්:*

7.1: සභාපතිගේ නායකත්වයෙන් යුක්තව සභාපති, ලේකම්, සහ ප්‍රධාන භාණ්ඩාගාරික ඇතුලත් වන සේ පස් දෙනෙකුගෙන් (05) සමන්විත මුදල් කාරක සභාවක්,කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත්කළ යුතුය.

7. 2: පක්ෂයේ විය හියදම් සඳහා අරමුදලක් ඇති කිරීමට මුදල් කාරක සභාව විසින් අවශ්‍ය විධි විධාන සැලසිය යුතුය.

7. 3: භාණ්ඩාගාරික විසින් පක්ෂයට ලැබෙන සියලුම මුදල් වලට කුවිතාන්සියක් යැවීම හා ගණන් තැබීම කල යුතු වේ.

7 .4: පක්ෂයට ලැබෙන්නාවූ මුදල්, කෘත්‍යාධිකාරී මණ්ඩලයේ උපදෙස් පිට, බැංකුවල, පක්ෂයේ නමින්, තැන්පත් කල යුතුය. බැංකුවල තැන්පත් කරන ලද මුදල් සමග ගනුදෙනු කලමියුත්තේ, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තුන්දෙනාගෙන් දෙදෙනෙකුගේ අත්සන් ඇතිවය.

7 .5:සභාපතිගේ හෝ ලේකම්ගේ හෝ පරිපාලන ලේකම් ගේ අනුමැතිය ඇතිව අවශ්‍ය, හදිසි වියදමක් කිරීමට භාණ්ඩාගාරිකට බලය තිබේ.එසේ කරන ලද වියදම් විස්තරයක් මුදල් කාරක සභාවට ඉදිරිපත් කල යුතුය.

7. 6: ගතවූ වර්ෂයේ අය වැය පිලිබඳ, ගණන් පරීක්ෂකයන් විසින් සකස් කර මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද, වාර්තාවක්, සෑම වර්ෂයකම ජාතික විධායක සභාවට ඉදිරිපත් කල යුතුය.

7 .7: වාර්ෂිකව විගණන වාර්තා මැතිවරණ කොමිසම වෙත ඉදිරිපත් කිරීම භාණ්ඩාගාරික විසින් සිදු කල යුතුය.

8. *දේපල*

8. 1: දේපල අත්පත් කර ගැනීම හෝ විකුිම හෝ කුලියට දීම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතුව සිදු විය යුතුය.

8. 2: පක්ෂයේ යම් දේපලක් විකුිම සඳහා ඔප්පුවට අත්වන් තැබිය යුත්තේ කවුරුන් දැයි කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කල යුතුය.

9. *පොදු විධිවිධාන.*

9. 1: යම්කිසි වර්ෂයක අලුත් නිලධාරීන් පත් කර නොගතහොත්, ක්‍රියාත්මක නිලධාරී මණ්ඩලය තව දුරටත් වලංගු වේ

එසේවෙතොත් නිලධාරී මණ්ඩලයේ ලේකම් ධුරය හැර වෙනත් තනතුරු වල පුරප්පාඩු පැවතියද ව්‍යවස්ථානුකුලව ගනපුරණය සහිතව කෘත්‍යාධිකාරී විධායක කමිටු විසින් ගනු ලබන තීරණ වලට ඉන් බලපෑමක් නොවිය යුතුය

9. 2: පක්ෂයේ යම් සංවිධානයක සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් (1/3) ඉල්ලා සිටි විට, එම සංවිධානයේ ලේකම් විසින්, සංවිධානයේ රැස්වීමක් කැඳ විය යුතුය.

9 .3: පක්ෂයේ සංවිධාන ගණපූරණය තුනෙන් එකක් (1/3) වේ.

9. 4: පක්ෂයේ යම්චන්ද විමසීමකදී, චන්ද සංඛ්‍යාව සමාන වූ විට, එම සංවිධානයේ සභාපතිට තීරක චන්දයක් හිමි වේ.

9. 5: පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය ඇතුළුයම් සංවිධානයක පුරප්පාඩුවක් ඇතිවුවහොත්, එම පුරප්පාඩුව කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පිරවිය යුතුය.

9 .6: නිලධාරී මණ්ඩලය විසින්, වාර්ෂිකව, සිය වත්කම්/බැරකම් ප්‍රකාශ, මැතිවරණ නීතිය ප්‍රකාර, මැතිවරණ කොමිසන් සභාව වෙත ලබා දීමට බැඳී සිටී.

10. *විශේෂ විධිවිධාන.*

පක්ෂය විසින්, ජනාධිපතිවරණය, මහා මැතිවරණය ඇතුළු සියලු මැතිවරණ සඳහා, සමාන අදහස් ඇති, විවිධ දේශපාලන පක්ෂ, සංවිධාන, ව්‍යාපාර සමග සන්ධාන ගත වීම සඳහා එකඟත්වයකට පැමිණෙන අවස්ථාවන්හිදී,

පක්ෂ නාමය හා/හෝ ලාංඡනය, පොදු අරමුණ වෙනුවෙන් ලබා දෙන්නේ නම් පක්ෂයේ ලේකම් ධුරය දරන්නා, එම සන්ධානයේද ලේකම් ධුරය දැරිය යුත්තේය.

යම් ලෙසකින් එම සන්ධානයේ ප්‍රධාන ලේකම් ධුරය හා/හෝ සම ලේකම් ධුරය දැරීම, මෙම පක්ෂයේ ලේකම් ධුරය දැරීමට බාධාවක් නොවන්නේය.

11 සාමාජික පක්ෂ සාමාජිකයන්ගේ විනය

පක්ෂ සන්ධානයක් ලෙස කටයුතු කරන අවස්ථාවන්හිදී සාමාජික පක්ෂ වල නියෝජිතයන් සාමාජිකයන් පිළිබද විනය කටයුතු එකී පුද්ගලයා අයත් පක්ෂය සතු වේ එසේ එම පක්ෂ විසින් නිර්දේශ කරනු ලබන විනය ක්‍රියා මාර්ග පක්ෂ ලේකම් වෙත ලැබී සතියක් තුල ක්‍රියාත්මක කල යුත්තේය

**විධායක සභාවේ අනුමැතිය සහිතව අත්සන් කලේ**

**ලේකම්**